# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2037/20 - 2017 සැප්තැම්බර් මස 21 වැනි බ්‍රහස්පතින්දා - 2017.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### *උතුරු මැද පළාතේ පළාත් සභාව*

1990 අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තියේ රෙගුලාසි

***උතුරු මැද පළාත් සභාවේ 1990 අංක 2 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය***

උතුරු මැද පළාත් සභාවේ 1990 අංක 2 දරන අධ්‍යාපන ප්‍රඥප්තියෙහි 12 වගන්තිය යටතේ උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රම සම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක, අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ,ඉංජිනේරු සහ සංස්කෘතික විෂය භාර අමාත්‍යවරයා වන මා විසින් පහත සඳහන් නියෝග මෙයින් පනවනු ලබන බව නිවේදනය කරමි.

පේශල ජයරත්න බණ්ඩාර,
ප්‍රධාන අමාත්‍ය හා අධ්‍යාපන විෂය භාර අමාත්‍ය.

2017 සැප්තැම්බර් මස 01 වන දින,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*නියෝග*

**01. පළාත් පාසල් සඳහා පහසුකම් සපයා දීම.**

I. උතුරු මැද පළාතේ සෑම පාසලක් සඳහාම ව්‍යුහය පිළිබඳ ප්‍රධාන සැලැස්මක් තිබිය යුතුය. මෙම සැලැස්ම යටතේ පාසැල් ගොඩනැගිලිවල පිහිටීම, ඒ ඒ ගොඩනැගිලි යටතේ එක් එක් අංශ පිහිටා ඇති ආකාරය සඳහන් කර තිබියයුතු අතර අනාගත වැඩි දියුණු කිරීම සඳහා යෝජනා කරන වෙනස් කිරීම් එහි විශේෂිතව පෙන්නුම්කර තිබිය යුතුය.

II. අදාළ පාසලේ සිටින ශිෂ්‍ය සංඛ්‍යාව, අනුමත ගුරු හා අනධ්‍යන සේවක සංඛ්‍යාව පිළිබඳව තොරතුරු ඇතුළත් පළාත් අමාත්‍යාංශ විසින් අනුමත කාර්ය මණ්ඩල ලේඛනය ප්‍රධාන පරිපාලන ඒකකය තුළ සෑම කෙනෙකුටම දැකිය හැකි වනසේ ප්‍රදර්ශනය කළ යුතුය.

III. එකී ලේඛනයට අනුව කාර්ය මණ්ඩලය පවත්වා ගැනීමට විදුහල්පතිවරයා විසින් තරයේ වග බලා ගත යුතුය.

1A - PG 3696 — 57 (2017/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

IV. පාසල් වර්ගීකරණයට අනුව තම පාසල සඳහා අවශ්‍යවන සියලු භෞතික හා මානව සම්පත් පිළිබඳ අවශ්‍යතාවය විදුහල්පති විසින් පාසල් සංවර්ධන කමිටුව සමග හඳුනාගත යුතු අතර, එම අවශ්‍යතා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා එවිය යුතුය.

**02. පාසල්වල අධීක්ෂණ කටයුතු.**

I. පාසල්වල අධීක්ෂණ කටයුතු ප්‍රමාණවත්ව හා කාර්යක්ෂමව සිදුකලයුතු අතර, ඒ සඳහා මෙහි සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කළ යුතුය.

II. එක් එක් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් තම කොට්ඨාසයට අයත් පාසල් අධීක්ෂණය සඳහා වාර්ෂික සැලැස්මක් සකස්කළ යුතුය. එකී සැලැස්ම කලාප අධ්‍යක්ෂකට පිටපතක් සහිතව තම කොට්ඨාශයේ සෑම පාසලකම විදුහල්පති වෙත පූර්වයෙන් ලබාදිය යුතු අතර, එකී සැලැස්මට අනුකූලව අධීක්ෂණ කටයුතු සිදුකළ යුතුය.

III. සෑම පාසලකම පහත සඳහන් අංශ වෙන් වෙන්ව අධීක්ෂණය කළ යුතුය.

(අ) පාසලේ ඉගැන්වීම් කටයුතු

(ආ) ගුරු හා සිසු පැමිණීම

(ඇ) වාර සටහන්, පෙළපොත් භාවිතය

(ඈ) පාසල් සංවර්ධන සමිතියේ කටයුතු

(ඉ) පාසලේ පරිසරය (පාසල් පිරියත)

(ඊ) අදාළ විෂයානුබද්ධ හා විෂය බාහිර ඉලක්ක සඳහා ළඟාවීම

(උ) පාසල් මූල්‍ය පාලනය

(ඌ) ගුරුභවතුන්ගේ හා සිසුන්ගේ කාර්ය සාධන මට්ටම

IV. අධීක්ෂණ කටයුතු, පවත්නා සියලුම අංශ ආවරණය වන පරිදි කිරීමට අදාළ සියලු නිලධාරීන් වගබලා ගත යුතු අතර, සේවා දින පොතෙහි ඒ බව සටහන් තැබිය යුතු ය.

V. පාසල් අධීක්ෂණය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය හා පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය නිකුත් කර ඇති උපදෙස් සංග්‍රහය හා හඳුන්වා දෙන ප්‍රමිති අදාළ කරගත යුතුය.

VI. කොට්ඨාස අධ්‍යක්ෂවරුන් පාසල් සම්බන්ධයෙන් මෙම සැලැස්මට අමතරව හදිසි විමර්ශන කටයුතු ද සෑම පාසලක්ම ආවරණය වන පරිදි අධ්‍යයන වාරයකට එක් වරක් සිදුකළ යුතුය.

VII. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් තම කලාපයට අයත් සියලුම කොට්ඨාස අධ්‍යක්ෂවරුන්ගේ රාජකාරි කටයුතු අධීක්ෂණය කළ යුතුය. ඒ සඳහා වාර්ෂික සැලැස්මක් සකස් කළ යුතුය. මෙයට අමතරව හදිසි අධීක්ෂණ පැවැත්විය යුතුය.

VIII. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ඉදිරි වර්ෂයේ අධීක්ෂණ සැලැස්ම සකස් කර විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් මෙන් පසු අදාළ වර්ෂයේ නොවැම්බර් 15 ට කලාප හා කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් මඟින් සියලුම විදුහල්පතිවරුන් වෙත ලැබීමට සැලැස්විය යුතු ය.

IX. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කලාප හා කොට්ඨාස අධීක්ෂණය කිරීම සඳහා සැලැස්මක් සකස් කළයුතු අතර, එය වාර්ෂිකව සකස් කළ යුතුය. ඊට අමතරව අවශ්‍යතාව පරිදි හදිසි අධීක්ෂණ කළ යුතුය.

**03. ගුරු සේවයට හා ඊට සම්බන්ධ අනෙකුත් සේවාවන් සඳහා පුද්ගලයින් බඳවා ගැනීම.**

I. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 17 පරිච්ඡේදය යටතේ සඳහන් විධිවිධාන හා 1990 අංක 28 දරන පළාත් සභා (සංශෝධිත) පනතින් සංශෝධිත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය යටතේ සඳහන් විධිවිධානයන්ට අනුකූලව පළාත් බලධාරීන් විසින් ක්‍රියා කළයුතුය.

II. ගුරු සේවයට බඳවා ගැනීමේදී අනුමත උතුරු මැද පළාත් ගුරු සේවා ව්‍යවස්ථාව අනුවද අනෙකුත් සේවාවන් සඳහා අදාළ බඳවා ගැනීමේ පරිපාටි අනුවද බඳවාගැනීම් කළ යුතුය.

III. පළාත්සභා රාජ්‍ය සේවයට ද්විතීයනය කිරීම මත පත්වන ගුරුවරුන් සම්බන්ධයෙන් පළාත් බලධාරිත්වය විසින් එකී තනතුරට පත්කිරීමට අදාළ ලිඛිත නීතියෙහි සීමාවන්ට යටත්ව එය කළ යුතුය.

IV. ගුරුවරුන් බඳවා ගැනීමේ දී අනිවාර්යයෙන්ම දුෂ්කර හෝ අතිදුෂ්කර පාසල් වල පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. එම පාසලේ අවම වශයෙන් වසර තුනක් ඔහු/ඇය සේවය කළ යුතු ය.

**04. විදුහල්පතිවරු ස්ථානගත කිරීම.**

I. පළාත් සභාව වෙත මුදාහරින ලද විදුහල්පතිවරයෙකු ස්ථානගත කිරීමේදී ජ්‍යෙෂ්ඨතාවය, මෙන්ම කුසලතාවද පෙන්වා ඇති දක්ෂතා සැලකිල්ලට ගනිමින් පුරප්පාඩු තනතුරකට අනුයුක්ත කළ යුතුය.

II. යම් විදුහලක විදුහල්පති පුරප්පාඩුවක් ඇතිවූ විට පළාත තුළ සිටින ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් වෙතින් අයදුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණයකට ලක් කොට එයින් ඉහළම සුදුසුකම් සහිත කුසලතා ලබා ගන්නා නිලධාරියා ඒ සඳහා පත් කළ යුතුය.

III. එසේ වුවද යම් පාසලක විදුහල්පති පුරප්පාඩුවක් හදිසියේ හටගන්නා අවස්ථාවක ස්ථිර ශ්‍රේණිධාරි විදුහල්පතිවරයෙකු පත් කරන තෙක් අදාළ පුරප්පාඩු තනතුරට තාවකාලික ලෙස විදුහල්පතිවරයෙකු පත්කිරීම සඳහා ඉහත විධිවිධාන බාධාවක් නොවිය යුතුය.

IV. විදුහල්පති පුරප්පාඩු සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පහත අයගෙන් සමන්විත විය යුතුය.

(අ) පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්

(ආ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

(ඇ) අදාළ විදුහල පිහිටි කලාපයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ

(ඈ) අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන)

V. වාර්ෂික විදුහල්පති ස්ථානමාරුවීම් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කළ යුතුය.

**05. අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ සියලුම පුද්ගලයින් මාරු කිරීම හා විනය පාලනය.**

අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ සියලුම නිලධාරීන්ගේ ස්ථාන මාරු කිරීම් හා විනය පාලනය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සහ 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන මෙන්ම උතුරු මැද පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටි රීතීන්ට අනුකූලව සිදුකළ යුතුය.

**06. පළාත් අධ්‍යාපන සංවර්ධන සැලැස්ම සකස් කිරීම.**

I. පළාත් අධ්‍යාපන සංවර්ධන සැලැස්ම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ යෝජනා අනුව පූර්ව වර්ෂයේ ඔක්තෝම්බර් තිස් එකට (31)පෙර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පිළියෙල කළ යුතු අතර, මෙය තුන් අවුරුදු සැලැස්මක් විය යුතුය. පිළියෙල කරනු ලබන තුන් අවුරුදු සැලැස්ම පළාත් අමාත්‍යාංශ ලේකම් විසින් පළාත් අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

II. තුන් අවුරුදු පළාත් අධ්‍යාපන සැලැස්මට අනුකූලව එක් එක් ලිත් වර්ෂය සඳහා වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැලැස්මක් පිළියෙල කර එය සෑම පූර්ව වර්ෂයකම නොවැම්බර් 30ට පෙර පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඉදිරිපත් කළ යුතු අතර ලේකම්වරයා නිර්දේශ සහිතව අදාළ සැලැස්ම සඳහා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු ය.

III. කොට්ඨාස හා කලාප සංවර්ධන සැලසුම් පූර්වයේ සඳහන් දින අනුවම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගත යුතුය.

**07. කලාප, කොට්ඨාස හා පාසල් මට්ටමින් අධ්‍යාපන සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කිරීම.**

I. අනුමැතිය ලත් තුන් අවුරුදු හා වාර්ෂික පළාත් අධ්‍යාපන සංවර්ධන සැලසුම්වලට අනුකූල වන පරිදි එක් එක් කලාප සඳහා තුන් අවුරුදු හා වාර්ෂික කලාප අධ්‍යාපන සංවර්ධන සැලසුම් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ උපදෙස් පරිදි කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් පිළියෙල කළ යුතුය.

II. අනුමත තුන් අවුරුදු හා වාර්ෂික පළාත් අධ්‍යාපන සංවර්ධන සැලසුම්වලට අනුකූල වන පරිදි එක් එක් අධ්‍යාපන කොට්ඨාස සඳහා තුන් අවුරුදු හා වාර්ෂික කොට්ඨාස අධ්‍යාපන සැලසුම් කලාප අධ්‍යක්ෂගේ උපදෙස් පරිදි කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් විසින් පිළියෙල කළ යුතුය.

III. අනුමත තුන් අවුරුදු වාර්ෂික පළාත් අධ්‍යාපන සංවර්ධන සැලසුම්වලට අනුකූල වන පරිදි සෑම පාසලක් සඳහාම තුන් අවුරුදු හා වාර්ෂික අධ්‍යාපන සංවර්ධන සැලසුම් පාසල් සංවර්ධන කමිටුවේ ද නියෝජනයන් සහිතව කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකගේ උපදෙස් පරිදි විදුහල්පති විසින් පිළියෙල කළ යුතුය.

IV. පාසල් මට්ටමින් පිළියෙල කරන වාර්ෂික සංවර්ධන සැලසුම් සෑම පූර්ව වර්ෂයකම නොවැම්බර් මස 15 දිනට පූර්වයෙන්ද, තුන් අවුරුදු සැලසුම් ඔක්තෝම්බර් 31ට පෙරද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත්කර අනුමැතිය ලබාගෙන විදුහල්පති විසින් පාසල තුළ ක්‍රියාත්මක කළ යුතුය.

V. පළාත්, කලාප, කොට්ඨාස හා පාසල් මට්ටමින් ක්‍රියාත්මක වන සංවර්ධන සැලැසුම් ක්‍රියාත්මක කිරීමේදී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් සහ විදුහල්පතිවරුන් අදාළ වන පරිදි සිය අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා පෞද්ගලිකව වගබලා ගත යුතුය.

**08. කාර්ය මණ්ඩල ඇගයීම.**

I. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පාසල්වල සේවය කරන ගුරුවරුන් හා විදුහල්පතිවරුන් ඇගයීම සෑම වර්ෂයකම ජූලි 15 දිනට පෙර සිදු කළ යුතුය.

II. විදුහල්පතිවරයාගේ වැඩ කටයුතු ඇගයීමේදී පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව පාසලට ලබාදෙන ලද වාර්ෂික ඉලක්ක සපුරා ඇත්ද, පාසල් සමස්ත අධ්‍යාපනික ප්‍රගතිය කෙබඳු ද යන්න පිළිබඳව අමාත්‍යාංශ ලේකම් විසින් පත්කරනු ලබන මණ්ඩලය වාර්ෂිකව ඇගයීම් කළ යුතු අතර ඊට අදාළ වාර්තාව ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

III. සෑම පාසලක්ම පළමු, දෙවන හා තෙවන වාර පරීක්ෂණ වල ලකුණු සෑම ශ්‍රේණියක් සඳහාම සෑම විෂයයක් යටතේම විශ්ලේෂණය කළ යුතු අතර, ඒ ඒ විෂය ඉගැන්වෙන ගුරුවරයාගේ කාර්ය සාධනය හා ප්‍රගතිය එම විශ්ලේෂණය සහ අදාළ වන පරිදි ජාතික විභාග ප්‍රතිඵල විශ්ලේෂණය මත පදනම්ව සිදු විය යුතුය.

IV. විදුහල්පතිවරයා විසින් මෙම විශ්ලේෂණය සෑම වර්ෂයක් අවසානයේම, තෙවන වාරයේ පාසල් නිවාඩුවට පෙර කලාප අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතු අතර, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ඇගයීමට පාත්‍ර වියයුතු ගුරුවරුන්ගේ නාමලේඛනය අදාළ ප්‍රතිඵල විශ්ලේෂණය සමග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට ජනවාරි 30 ට ප්‍රථම ලබා දිය යුතුය. එලෙස ලබා දෙන ලද ලේඛනයන්හි නිරවද්‍යතාව විමසීමෙන් පසුව සුදුසු පරිදි සෑම වසරකම ජූලි 15 ට පෙර විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් ඇගයීම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ සිදු කළ යුතුය.

V. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එක් එක් පාසල සඳහා වාර්ෂිකව ලබා දෙනු ලබන ප්‍රතිඵල ඉලක්ක අදාළ වර්ෂයේදී ළඟා කරගෙන තිබේද? නැද්ද? යන වගත්, ළඟා කරගෙන නොතිබේ නම් ඒ සඳහා බලපා තිබෙන හේතු කවරේද යන්න පිළිබඳ වාර්තාවක් අනුගාමී වර්ෂයේ මැයි 30ට පෙර ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

**09. සේවාස්ථ පුහුණු වැඩසටහන්**

I. අවශ්‍ය විෂයයන් සඳහා නේවාසික පුහුණු අඛණ්ඩව පැවැත්විය යුතු ය.

II. ඉහත සඳහන් වගන්ති යටතේ ගනු ලබන ක්‍රියාමාර්ගයන්ට අතිරේකව හඳුනාගන්නා ලද විෂයයන් සඳහා නේවාසික පුහුණු කඳවුරු පැවැත්විය යුතුය.

III. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සෑම වසරකම දෙසැම්බර් 31 ට පෙර ඊළඟ වර්ෂය සඳහා සම්පත්දායකයින්ගෙන් අයදුම්පත් කැඳවා ලියාපදිංචි කරගත යුතුය. සම්පත්දායකයන් සංචිතය සඳහා තෝරාගන්නා අය අදාළ විෂය සඳහා පශ්චාත් උපාධි හෝ ඒ හා ආසන්න මට්ටමේ සුදුසුකම් ලබා තිබිය යුතුය.

IV. සියලුම ගුරු පුහුණු කටයුතු පාසල්වල අධ්‍යාපන ක්‍රියාවලියට බාධා නොවන පරිදි පැවැත්වීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වගබලා ගත යුතුය.

**10. වාර විභාග**

I. සෑම පාසලකම වාර විභාග පැවැත්වීම පහත ආකාරයට විය යුතුය.

(අ) පළමු වාර විභාගය පාසල් පාදකව සිදු කිරීම.

(ආ) දෙවන වාර විභාගය කලාප මට්ටමින් හෝ පළාත් මට්ටමින් සිදු කිරීම.

(ඇ) අවසාන වාර විභාගය පළාත් මට්ටමින් පැවැත්වීම.

II. සියලු වාර විභාග සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම, යතුරු ලියනය, මුද්‍රණය, බෙදා හැරීම, උත්තර පත්‍ර සකස් කිරීම, ලකුණු විශ්ලේෂණය සම්බන්ධයෙන් පාසල්, කලාප හා පළාත් මට්ටමින් අධීක්ෂණ කමිටු පත් කළ යුත්තේය.

III. වාර විභාග ප්‍රශ්න පත්‍ර සකස් කිරීම සඳහා සෑම වර්ෂයකම දෙසැම්බර් 15 ට පෙර ප්‍රශ්ණ පත්‍ර සකස් කිරීමේ මණ්ඩල කොට්ඨාස, කලාප හා පළාත් මට්ටමින් පිහිටුවිය යුතුය.ප්‍රශ්ණ පත්‍ර මණ්ඩල සකස් කිරීම අතිරේක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(සංවර්ධන), නියෝජ්‍ය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ(සංවර්ධන) ගේ වගකීමක් වන අතර, ඉහත සියලු කටයුතු අධීක්ෂණය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකගේ වගකීමක් වන්නේය.

IV. කමිටු නිලධාරීන් විභාග වැරදි සම්බන්ධව වගකිව යුතු ය.

V. පාසල් මට්ටමින් පවත්වන වාර විභාග සඳහා ක්‍රියාත්මක කමිටු සංයුතිය කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ ද, කලාප මට්ටමින් පවත්වන විභාග සඳහා ක්‍රියාත්මක කමිටු සංයුතිය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ද, පළාත් මට්ටමින් පවත්වන විභාග සඳහා වන කමිටු සංයුතිය පළාත් අධ්‍යාපන ලේකම් ද අනුමත කළ යුතුය.

VI. ශිෂ්‍යයන්ට සෑම වාර විභාගයකදීම ඒ ඒ විෂයයට තමන් ලබාගත් ලකුණු ඇතුළත් ප්‍රගති වාර්තාව ලබාදීම වාර අවසාන නිවාඩු දීමට පෙර දින සිදු කිරීමට සෑම විදුහල්පතිවරයෙකුම වග බලාගත යුතුය.

VII. ඉහත සියලු විභාග කටයුතු මෙහෙයවීම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විභාග ඇගයීම් කටයුතු භාර නියෝජ්‍ය සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යක්ෂගේ උපදෙස් මත සිදු කළ යුතුය.

**11. පාසල් ශිෂ්‍යයන් අතර පවත්වනු ලබන විවිධ තරගාවලි සඳහා විනිශ්චය මණ්ඩල යොදවා ගැනීමේ දී පහත සඳහන් අයුරින් ක්‍රියා කළ යුතුය.**

I. කොට්ඨාසය තුළ පැවැත්වෙන තරඟ සඳහා විනිශ්චය මණ්ඩලය පිටස්තර කොට්ඨාසයක සේවය කරන අධ්‍යයන කාර්ය මණ්ඩල වලට අයත් අය හෝ විෂය ප්‍රවීණයන් අතරින් තෝරා ගැනීම.

II. කලාපය තුළ පැවැත්වෙන තරඟ සඳහා පිටස්තර කලාපවල සේවය කරන අය යොදා ගැනීම.

III. පළාත් තරඟ සඳහා පළාතේ දිස්ත්‍රික්ක දෙකේ නියෝජිතයන් සහ පිටස්තර පළාතක නියෝජිතයන් සමානව ඇතුළත් වන පරිදි තෝරා ගැනීම.

**12. විධිමත්, නොවිධිමත් සහ විශේෂ අධ්‍යාපන වැඩසටහන්**

I. විධිමත් නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ජාතික වශයෙන් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කරනු ලබන උත්සව, විවිධ සැමරීම්වලට අදාළ දැනුම්දීම්වලට අනුව පළාතේ පාසල් ද කටයුතු කළ යුතුය.

II. පළාතට අනන්‍ය උත්සව පැවැත්වීම වාර්ෂික දින දර්ශනයේ ඇතුළත්කර පූර්ව උපදෙස් ලබාදී එකී උත්සව පැවැත්වීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් ක්‍රියා කළ යුතුය.

III. විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳව ජාතික හා පළාත් ප්‍රතිපත්ති හා චක්‍රලේඛ අනුව කටයුතු කළ යුතු අතර, එය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණය හා මඟපෙන්වීම යටතේ සිදුවිය යුතුය.

**13. වත්කම් කළමනාකරණය කිරීම.**

I. යම් පාසලක් වෙත සුබ පතන්නන් යම් පරිත්‍යාගයක් කරන්නේ නම් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමැතියට යටත්ව සිදු කළ යුතු ය.

II. යම් පාසලක විදුහල්පති පාසලට අයත් සියලු ගොඩනැගිලි හා දේපල නඩත්තු කරමින් නිසි පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතු වන්නේය.

III. රජයේ හෝ පළාත් සභා ප්‍රතිපාදන මත යම් පාසලක අවශ්‍යතාවය ඇති ඉගැන්වීමේ ආධාර, උපකරණ, දෘශ්‍යාධාර හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ මෙන්ම ලී බඩු, පරිගණක හා අනෙකුත් කවර හෝ අවශ්‍යතා සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත පෙර වර්ෂයේ ජුනි මස 30 දිනට පෙර දැනුම් දිය යුතු ය.

IV. රජයේ හෝ පළාත් සභා ප්‍රතිපාදන මත පාසල්හි අවශ්‍යතා සඳහා අවශ්‍ය ඉගැන්වීමේ උපකරණ දෘශ්‍යාධාර හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ පාසල් විද්‍යාගාර සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ ලබාගැනීම සඳහා සෑම වර්ෂයකම ජුනි 30 ට පෙර ඊට අදාළ ඉල්ලීම් පළාත් අධ්‍යක්ෂ මගින් පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඉදිරිපත් කළ යුතු අතර, අනුගාමී වර්ෂයේ පළමු වාරය අවසානවීමට ප්‍රථම අදාළ උපකරණ පාසල්වලට බෙදා හැරීම සඳහා පළාත් අධ්‍යාපන ලේකම් හැකි සියළු පියවර ගත යුතුය.

V. සෑම පාසලක් සඳහාම ශිෂ්‍ය ප්‍රමාණයට ගැළපෙන පරිදි පුස්තකාලයක් පවත්වාගෙන යායුතු අතර එය භාරව කටයුතු කිරීමට හැකි සෑම විටම පුස්තකාල විෂය පිළිබඳ දැනුම ඇති ගුරුවරයකු යෙදිය යුතුය.

VI. අවම වශයෙන් සෑම ශිෂ්‍යයකුම සතියකට එක් කාලපරිච්ඡේදයක් හෝ පුස්තකාල පරිහරණයට යොමුවන පරිදි පාසල් කාල සටහන පිළියෙල කළ යුතුය.

VII. පාසැල්, කොට්ඨාස, කලාප, පළාත් මට්ටමින් කියවීමේ දින තරග වාර්ෂිකව පැවැත්වීමට කටයුතු කළ යුතු ය.

14. කොට්ඨාස හා කලාප අධ්‍යාපන කාර්යාල සීමාවන් නිර්ණය කිරීම, පළාත් අධ්‍යාපන අමාත්‍යවරයා පත් කරන කමිටුවක නිර්දේශ සැලකිල්ලට ගෙන අමාත්‍යවරයා තිරණය කළ යුතුය.

15. පළාතේ පොදු අවශ්‍යතා මත පළාත් පාසල් සඳහා හදිසි නිවාඩු දින පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් තීරණය කළ හැකිය.

16. විභාග ප්‍රතිඵල විශ්ලේෂණය කිරීමෙන් පසු ඉගෙනීමෙහි පසුබට සිසුන් සඳහා අධ්‍යාපන ප්‍රතිපෝෂණ වැඩ සටහන් විදුහල්හල්පති ක්‍රියාත්මක කළ යුතු අතර අදාළ කොට්ඨාශ හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ අධීක්ෂණය කළ යුතුය.

17. පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ සමග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ පළාත් පාසල් සිසුන් සඳහා අවශ්‍ය වෛද්‍ය පරීක්ෂණ,ප්‍රතිකාර ලබාදීම සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ආදිය සැලසුම් කිරීම කළ යුතු අතර පළාත් අධ්‍යාපන ලේකම් එම කරුණු නියාමනය කළ යුතුය.සෑම පාසලක් තුළම සෞඛ්‍ය සමාජයක් පිහිටුවිය යුතු ය.

18. අධ්‍යාපන විෂය භාර අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රතිපත්ති හා ප්‍රමිතීන්ට අනුව පළාතේ පාසල් ශ්‍රේණිගත කිරීම හා වර්ග කිරීම, නව පාසල් විවෘත කිරීම, සිදු කළ යුතුය.

19. උතුරු මැද පළාත තුළ පාසල් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් සඳහා උපකාරක පන්ති පැවැත්වීම.

I. පාසැල් සිසුන් සඳහා බාහිර උපකාරක පන්ති පවත්වනු ලබන ආයතන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි විය යුතු අතර, ඒ සඳහා වන නිර්ණායක පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ ඉදිරිපත් කරන නිර්ණයන්වලට යටත්ව එකී ආයතන පවත්වාගෙන යා යුතුය.

II. පාසල් පවත්වන සෑම දිනකම 14.00 පැය දක්වාද ඉරිදා දින14.00 පැය දක්වාද, පුර පසළොස්වක පෝය දින හා විශේෂිත ආගමික හා ජාතික උත්සව දිනයන්හි දී උතුරු මැද පළාත තුළ පාසැල් සිසුන් සඳහා පෞද්ගලික උපකාරක පන්ති කුමනාකාරයකින් හෝ පැවැත්වීම නොකළ යුතුය.

III. මෙම නියමයන් බාහිර උපකාරක පන්ති පැවැත්වීම සඳහා අනුබල දීමක් නොවන අතර, ඉගැන්වීමේ ප්‍රමිතිය ආරක්ෂා කිරීම, විනය ගරුක හා සදාචාරාත්මක හැසිරීම යටතේ ක්‍රමවත්ව ශිෂ්‍ය අධ්‍යාපනය පවත්වා ගැනීම සඳහාම අදාළ විය යුතුය.

IV. මෙම රීතිය කඩ කරමින් පාසල් ශිෂ්‍යයන් සඳහා පෞද්ගලික උපකාරක පන්ති පවත්වන තැනැත්තන්/ ආයතන හෝ ඒ සඳහා අනුබල දෙන අය මේ යටතේ වරදක් සිදු කළාසේ සලකන අතර, බලයලත් අධිකරණයක් ඉදිරියට ගෙන යා මෙන් පසු වරදකරුවන් බවට පත් වුවහොත් රු 50000/. නො අඩු දඩයකට හෝ තුන් මසකට නොඅඩු සිර දඬුවමකට යටත් කොට දඬුවම් කළ යුතු ය.

V. කිසියම් ගුරුවරයකු හෝ අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ කෙනෙකු/ රාජ්‍ය සේවයේ නිලධාරියකු පාසල් කාලය තුළ පෞද්ගලික නිවාඩු ලබාගෙන උපකාරක පන්තිවල ඉගැන්වීම් කටයුතු වල යෙදෙන්නේ නම් ඔහු/ඇය වරදක් කළාසේ සලකා විනයානුකූලව කටයුතු කිරීම පිණිස පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් විනය බලධරයා වෙත ඒ පිළිබඳ වාර්තා කළ යුතුය.

VI. සතියේ සෑම දිනකම පෙරවරු 7.00 ට පෙර සහ රාත්‍රී 7.00 න් පසු පාසල් දරුවන් සඳහා උපකාරක පංති පැවැත්වීම කිසිසේත්ම නොකළ යුතු අතර, එය ළමා හිංසනයක්/ ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් සේ සලකා ක්‍රියා කළ යුතුය.

VII. කිසියම් ශිෂ්‍යයකු පාසල් කාලය තුළ පාසලට නොපැමිණ උපකාරක පන්තිවලට සහභාගිවන බව අනාවරණය වුවහොත් එම ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවට එරෙහිව විනයානුකූලව කටයුතු කිරීම විදුහල්පතිවරයා විසින් සිදු කළ යුතුය.

VIII. ජාතික විභාග සඳහා ඉදිරිපත් වන ශිෂ්‍යයන්ගේ පැමිණීමේ සාමාන්‍යය ජාතික ප්‍රතිපත්තියට අනුව 80% විය යුතු අතර, එය සම්පූර්ණ නොකරන ලද සිසුන් සඳහා නියමිත විෂය නිර්දේශය ආවරණය නොකරන ලද සිසුන් සේ සලකා විභාගයට ඉදිරිපත් වීමට අවසර නොදිය යුතු ය. මෙම පැමිණීම පිළිබඳව ගණනය කිරීම් අධ්‍යයන වාර මට්ටමින් කළ යුතුය.

**උතුරු මැද පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය**

20. උතුරු මැද පළාතේ අධ්‍යාපන ක්‍රියාවලිය වඩාත් ඵලදායී වීම සඳහාත් ගුරුවරුන්ගේ හා ශිෂ්‍යන්ගේ සුබ සාධනය සඳහාත් යෝග්‍ය වන පරිදි ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළයුතුය.

21. උතුරු මැද පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම 1987 අංක 42 දරණ පළාත් සභා පනතේ 32 වන වගන්තියෙහි විධිවිධාන හා ඊට අනුශංගික විධිවිධානයන්ට අනුකූලව විය යුතුය.

**22. උතුරු මැද පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් කරුණු එහි අරමුණු විය යුතුය.**

I. අධ්‍යාපනය සැම විටම ශිෂ්‍ය කේන්ද්‍රිය විය යුතු බැවින් ගුරුභවතුන්ගේ ස්ථාන මාරුවීම් ලබාදීමේදී ශිෂ්‍යයන්ගේ අවශ්‍යතා ප්‍රමුඛ ස්ථානයෙහිලා සැලකිය යුතුය.

II. ගුරුවරුන්ගේ වෘත්තිය සුරක්ෂිතභාවය පිළිබඳව විශ්වාසය තහවුරු වන ආකාරයට හා අසාධාරණ ගුරු මාරු පිළිබඳව අනිසි බියකින් තොරව සේවය කළ හැකි පරිද්දෙන් සේවා තෘප්තිය උපරිම අයුරින් හිමිකර ගත හැකි ලෙස ස්ථාන මාරු සිදුවිය යුතුය.

III. අධ්‍යාපනය සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ දක්නට ලැබෙන විෂමතාවයන් හැකිතාක් දුරට අවම කිරීම ගුරු මාරු ප්‍රතිපත්තියේ මූලික අරමුණ විය යුතුය.

IV. කිසියම් අධ්‍යාපන කලාපයක, කොට්ඨාසයකට හෝ පාසැලකට සීමාවී ඇති මානව සම්පත් පළාතේ අනිකුත් ප්‍රදේශයන්හි වසන ශිෂ්‍යයන්ටද ප්‍රයෝජනවත්වන ආකාරයට ගුරු සේවයේ නියුතු මානව සම්පත් සාධාරණ පරිද්දෙන් බෙදියන ලෙසට ගුරු ස්ථාන මාරු සිදු විය යුතුය.

V. අධ්‍යාපනයේ ගුණාත්මක භාවය වර්ධනය කිරීමේ කාර්යය රදා පවතින්නේ ගුරුවරුන්ගේ දැනුම හා කුසලතාව මත බැවින්, ගුරු ස්ථානමාරු ප්‍රතිපත්තිය තුළින් ගුරුභවතුන්ට සිය දැනුම හා කුසලතා වර්ධනය කරගැනීම සඳහා අවකාශ සැලසිය යුතුය.

VI. ප්‍රදේශයේ අදාළ ක්ෂේත්‍රයේ මානව සම්පත් විධිමත් කළමනාකරණය තුළින් උපරිම කාර්යක්ෂමතා කෙරෙහි යොමු කිරීම මෙම ප්‍රතිපත්තිය මගින් සලස්වාදිය යුතුය.

VII. කිසියම් ගුරුභවතෙකුට විරුද්ධව විනයානුකූල ක්‍රියා මාර්ගයක් ගන්නා අවස්ථාවක හෝ එසේ ආසන්න අවස්ථාවක එම විනයානුකූල ක්‍රියාමාර්ග පහසු කරන ස්ථාන මාරුවීමක් හැර අන් සෑම අවස්ථාවක දී ම ගුරු සේවයේ ස්ථාන මාරු විධිමත් පරිදි පිහිටුවන ලද ගුරු ස්ථානමාරු මණ්ඩලයක නිර්දේශය මතම සිදුවිය යුතුය.

VIII. කිසියම් ගුරුභවතෙකුට විරුද්ධව විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගනිමින් පවතින අවස්ථාවක හෝ එසේ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීමට ආසන්නව පවත්නා අවස්ථාවක හෝ හුදෙක්ම සේවයේ අවශ්‍යතා මත ඉතා හදිසි සහ සුවිශේෂ අවස්ථාවන්හිදී සහ ගුරුභවතුන්ගේ ඉල්ලීම පරිදි සෞඛ්‍ය හේතූන් මත හෝ කලත්‍රයාගේ ස්ථාන මාරු හා සුහද මාරු හැර සෑම විටම ගුරුවරුන්ගේ ස්ථාන මාරු කළයුත්තේ විධිමත් පරිදි පිහිටුවනු ලබන ගුරු මාරු මණ්ඩලයක් මගිනි. ඉහත විශේෂිත හේතු මත කරනු ලබන ගුරු මාරුවීම් සම්බන්ධව ද සති දෙකක් ඇතුළත ගුරු මාරු මණ්ඩලය රැස්කර ඒ පිළිබඳව ගුරු මාරු මණ්ඩලය වෙත දැනගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය.

IX. වාර්ෂික ස්ථාන මාරු සඳහා උපලේඛන 01 යටතේ වූ A පෝරමයද ඉන් බැහැර ඉල්ලීමක් සඳහා B පෝරමය ද භාවිතා කළ යුතු ය.

X. සම්පූර්ණ කරන ලද ගුරු මාරු අයදුම්පත් ඉල්ලුම්කරු විදුහල්පතිගේ නිර්දේශය සහිතව කලාප අධ්‍යක්ෂවරයා වෙත භාර දිය යුතුය. එම අයදුම්පත් ඉදිරි කටයුතු සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයාගේ වගකීමකි.

XI. සේවා අනුයුක්ත කිරීම් කිසිසේත්ම නොකළ යුතුය. ගර්භනී කාන්තාවන් සඳහා චක්‍රලේඛ ප්‍රකාරව කරනු ලබන අනුයුක්ත කිරීම් ද මාරු මණ්ඩලයේ නිර්දේශ මත ම සිදු කළ යුතු ය.

කලාප ගුරු මාරු මණ්ඩල සෑම මසකම තුන්වන සතියේ සිකුරාදා දින ද පළාත් ගුරු මාරු මණ්ඩල සෑම මසකම හතරවන සතියේ සිකුරාදා දින ද පමණක් රැස් විය යුතු ය.

XII. කිසිදු පාසලක ගුරු අතිරික්තයක් ඇති නොවන පරිදි වාර්ෂික සහ අනෙකුත් ස්ථානමාරු කිරීම් සඳහා තරයේ වගබලා ගත යුතු ය.

**23. ස්ථාන මාරු සඳහා පහත සුදුසුකම් තිබිය යුතුය :-**

I. සියලුම වර්ගයේ ස්ථාන මාරුවීම් සඳහා මුල් පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි සපුරා තිබිය යුතුය. තවද නැවත සේවයේ පිහිටුවන ලද අවස්ථාවේ එයට ඇතුළත් කොන්දේසි ද සපුරා තිබිය යුතුය.

II. පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය විසින් තීන්දු කර ඇති අවම ලකුණු සීමාව හා කාලය සම්පූර්ණ කර තිබිය යුතුය.

**24. පාසැල් වර්ගීකරණය පහත ආකාරයට විය යුතු අතර ජාතික හා පළාත් ගුරු මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතා මත කාලීනව සිදු කරන පාසල් වර්ගීකරණයක් ඒ ඒ අවස්ථාවේදී අදාළ කරගත යුතුය.**

(1) වඩා ප්‍රියමනාප පාසල්

(2) ප්‍රියමනාප පාසල්

(3) ප්‍රියමනාප නොවන පාසල්

(4) දුෂ්කර පාසල්

(5) අති දුෂ්කර පාසල්

**25. පළාත් ගුරු සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි ස්ථාවර කමිටුව විසින් නම් කරනු ලබන පාසලක අනිවාර්ය අවම සේවා කාලයක් සෑම ගුරුභවතෙකු විසින්ම සේවය කළ යුතුය. ඒ අනුව,**

(1) අති දුෂ්කර හෝ දුෂ්කර පාසලක - අවුරුදු 03 (අවම)

(2) ප්‍රියමනාප නොවන පාසලක - අවුරුදු 04 (අවම)

(3) ප්‍රියමනාප පාසලක - අවුරුදු 05 (උපරිම)

(4) වඩා ප්‍රියමනාප පාසලක - අවුරුදු 05 (උපරිම)

**26. ස්ථාන මාරු ලබාදීම සම්බන්ධයෙන් ලකුණු ලබාදෙන ක්‍රමය පහත ආකාරයට විය යුතුය.**

I. ස්ථාන මාරු ලබාදීමේදී උතුරු මැද පළාතේ ඇති අධ්‍යාපන කොට්ඨාස ප්‍රධාන කොටස් දෙකට වෙන්කර සලකනු ලැබේ. කැබිතිගොල්ලෑව කලාපය, දිඹුලාගල කලාපය හිගුරක්ගොඩ කලාපයේ, මැදිරිගිරිය කොට්ඨාසය, ඇලහැර කොට්ඨාසය හා අනුරාධපුර කලාපයේ විලච්චිය කොට්ඨාසය හා ගලෙන් බිඳුණුවැව කලාපයේ, ගලෙන්බිඳුණුවැව කොට්ඨාසය එක කාණ්ඩයකට අයත්වේ. මෙම කලාපවලට අයත් පාසල් පහත පරිදි වර්ගිකරණය කර ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

A

| *පාසැල් වර්ගය* | *වසරකට ලකුණු* |
|---|---|
| අති දුෂ්කර | 10 |
| දුෂ්කර | 08 |
| අනෙකුත් පාසල් | 05 |

II. උතුරු මැද පළාතේ සෙසු අධ්‍යාපන කොට්ඨාස සමානව සලකනු ලබන අතර, ඒ කොට්ඨාසවල සේවා කාලය සඳහා පහත සඳහන් පරිදි ලකුණු ප්‍රදානය කෙරේ.

B

| පාසැල් වර්ගය | වසරකට ලකුණු |
|---|---|
| දුෂ්කර | 07 |
| අති දුෂ්කර | 08 |
| ප්‍රියමනාප නොවන | 05 |
| ප්‍රියමනාප | 03 |
| ඉතා ප්‍රියමනාප | 02 |

III. ඉහත (1) සහ (2) හි සඳහන් කරුණු වලට අමතරව එක් වරක් පමණක් ගණනය කරන පරිදි විවාහවී නම් අමතර ලකුණු 02ක්ද, අවුරුදු 07 ටඅඩු ළමයින් සිටි නම් එක් ළමයෙකුට අමතර ලකුණු 02 බැගින් ප්‍රදානය කරනු ලැබේ. මුළු සේවා කාලය සඳහා වසරකට එක් ලකුණ බැගින් හිමිවේ. තවද අන්තර් පළාත් ස්ථාන මාරු අයදුම් කිරීමේ දී වසර 05 කට වඩා වැඩි වන අන්තර් පළාත් අයදුම්කරුවන් සඳහා වසරකට එක් ලකුණ බැගින් හිමි වේ. පළාත තුළ වසර දහයකට වඩා වැඩි සේවාකාලයක් ඇති ගුරුභවතුන් සඳහා අන්තර් ස්ථාන මාරුවීම් ලබාදීමේදී ඉහත ලකුණු ක්‍රමය අදාළ කර නොගත යුතුය.

IV. මාරුවීම් කරනු ලබන ලකුණු සීමාව පළාත් ගුරු මාරු මණ්ඩලය කලානුරූපිව තීරණය කළ යුතුය. කිසිදු හේතුවක් මත වෙනත් පළාතකට ගුරුවරුන් අනුයුක්ත නොකළ යුතුය.

27. I. අනුමත ගුරු කාර්ය මණ්ඩල ලේඛනය අනුව අදාළ විෂයයන් සඳහා නිශ්චිත කාලසටහනක් නොමැති ගුරුවරුන් අතිරික්ත සේ සැලකිය යුතු අතර, විදුහල්පතිවරයා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දැනුම් දී ඔහු කලාපය තුළ හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් අන්තර් කලාප තුළ හෝ පුරප්පාඩු පවත්නා පාසල්වලට එම ගුරුවරුන් වහාම ස්ථානගත කිරීමට කටයුතු කළ යුතුය.

II. අතිරික්ත ගුරු මාරුෑ-
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ ඉහත ලකුණු පටිපාටිය මඟින් අතිරික්ත ගුරුවරයා හෝ ගුරුවරුන් හඳුනාගත යුතුය. අඩුම ලකුණු ලබන ගුරුවරයා හෝ ගුරුවරුන් අතිරික්ත ලෙස සැලකිය යුතුය. යම් අධ්‍යාපන කලාපයකට අයත් පාසලක ගුරු ඌනතාවක් තිබියදී එම විෂයටම එම කලාපයේ තවත් පාසලක් ගුරු අතිරික්තයක් තිබේනම් එය තුලනය කිරිම කලාප මාරු මණ්ඩලයේ නිර්දේශ මත සිදුවිය යුතුය.

එක් කලාපයක යම් විෂයයකට අදාළව ගුරු ඌනතාවක් තිබියදී තවත් කලාපයක එම විෂයයටම ගුරු අතිරික්තයක් තිබේනම් එම අතිරික්තය තුලනය කිරීම අන්තර් කලාප ගුරු මාරු මණ්ඩලයේ නිර්දේශය මත සිදුකළ යුතුය.

III. තමන් අතිරික්ත ගුරුවරයකු බව දැනදැනම, රාජකාරි නොකර වැටුප් ලබා ගැනීම සිදුකිරීමේ වරදට අදාළ ගුරුවරයාට එරෙහිව විනයානුකූලව හා නීත්‍යානුකූලව කටයුතු කිරීම විනය බලධරයා විසින් කළ යුතුය. එමෙන්ම අතිරික්ත ගුරුවරුන් තබාගැනීම සම්බන්ධයෙන් විදුහල්පති, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, වරදක් කළා සේ සලකා එකී පාර්ශවයන්ට විනයානුකූලව සහ නිත්‍යානුකූලව ක්‍රියාකළ යුතු ය.

**28. මාරු මණ්ඩලය**

I. ස්ථාන මාරු අරමුණු කර ගෙන ගුරු මාරු මණ්ඩල පිහිටුවිය යුතුය.

II. ගුරු මාරු මණ්ඩල පහත සඳහන් මට්ටමෙන් ස්ථාපිත කළ යුතුය.

(අ) කලාප ගුරු මාරු මණ්ඩල.

(ආ) අන්තර්කලාප සහ අන්තර් පළාත් ගුරු මාරු මණ්ඩලය.

**29. ගුරු මාරු මණ්ඩල සංයුතිය ෑ-**

**(1)** *කලාප ගුරු මාරු මණ්ඩලය ෑ*

කලාප ගුරු මාරු මණ්ඩලයේ සභාපති කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විය යුතුය. එසේ නොමැතිනම් ඔහු නම්කරන නියෝජිතයෙකු විය යුතුය. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා සභාපති තනතුර සඳහා නම් කරන නියෝජිතයාට අමතරව තවත් නියෝජිතයන් දෙදෙනෙකු මාරු මණ්ඩලය සඳහා නම් කළ යුතු අතර, ආයතන කටයුතු භාර අධ්‍යක්ෂවරයා එයින් එක් අයෙකු විය යුතුය. හැකි සෑම විටම මෙම දෙදෙනා අතරින් එක් අයෙකු දෙමළ මාධ්‍ය නිලධාරියෙකු විය යුතුය. මීට අමතරව වෘත්තිය සමිති ආඥා පනත යටතේ ලියාපදිංචි කර ඇති වලංගු වෘත්තිය සමිති නම් කෙරෙන නියෝජිතයෙකු බැගින්ද ඇතුළත් විය යුතුය. ලේකම්වරයා ලෙස සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ(පාලන) පත්කළ යුතු ය.

**(2)** *අන්තර් කලාප හා අන්තර් පළාත් ගුරු මාරු මණ්ඩලය,*

(අ) පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ (සභාපති) විය යුතුය.

(ආ)පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නියම කරනු ලබන නියෝජිතයන් දෙදෙනෙකු සිටිය යුතු අතර මෙම දෙදෙනාගෙන් එක් අයෙකු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ආයතන කටයුතු භාර අධ්‍යක්ෂවරයා වියයුතු අතර, හැකි සෑම විටම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නම් කරන නිලධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකු දෙමළ මාධ්‍ය භාර අධ්‍යක්ෂවරයෙකු විය යුතුය.

(ඇ)වෘත්තීය සමිති නියෝජිතයින්ෑ වෘත්තිය සමිති ආඥාපනත අනුව වෘත්තිය සමිති නියෝජනය

(ඈ) අන්තර් කලාප හා අන්තර් පළාත් ගුරු මාරු මණ්ඩලයේ ලේකම් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන) විය යුතු ය.

(3) අන්තර් කලාප ගුරු මාරු මණ්ඩලය, අන්තර් පළාත් ගුරු මාරුවීම් සම්බන්ධව ද කටයුතු කළ යුතු ය.

(4) (I) * අයදුම්පත් කැඳවීම - මැයි මස මුල් සතිය සිට ජුනි මස 30 දක්වා

* අන්තර් කලාප හා අන්තර් පළාත් - සැප්තැම්බර් මස 30 ලැයිස්තු ප්‍රකාශ කිරීම.

* කලාප තුළ ගුරු මාරු ලැයිස්තුව - ඔක්තෝම්බර් මස 30

* අභියාචනා මණ්ඩලය - නොවැම්බර් මස 30

(II) වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත් සෑම වර්ෂයකම මැයි මස පළමු සතියේ සිට ආරම්භ කොට ජුනි මස 30 වන විට කැඳවා අවසන් කළ යුතු අතර නොවැම්බර් මස 30 වන විට ස්ථාන මාරු ලැයිස්තුව ප්‍රසිද්ධ කළ යුතුය.

**30. අභියාචනා මණ්ඩලය:**

I. ගුරු මාරු මණ්ඩලයේ තීරණයෙන් සෑහීමකට පත්නොවන ගුරුභවතෙකුට අභියාචනා මණ්ඩලයට අභියාචනයක් ඉදිරිපත් කළ හැකිය.

II. කලාප මට්ටමේ අභියාචනා මණ්ඩලයේ සභාපති පළාත් අධ්‍යක්ෂ වියයුතු අතර, අන්තර් කලාප හා අන්තර් පළාත් අභියාචනා මණ්ඩලවල සභාපති පළාත් අධ්‍යාපන ලේකම් හෝ ඔහුගේ නියෝජිතයා වන අතර, ඔහු විසින් නම් කරනු ලබන තවත් නියෝජිතයින් දෙදෙනෙකු ඇතුළත් විය යුතුය. එම නිලධාරීන් දෙදෙනාගෙන් එක් අයෙකු මාරු මණ්ඩලයේ සේවය කළ අයෙකු විය යුතුය. අනෙක් නිලධාරියා මාරු මණ්ඩලයේ සේවය නොකළ අයෙකු විය යුතුය. කලාප මාරු අභියාචනා මණ්ඩලයේ සංයුතියද මේ ආකාරයටම සකස් විය යුතුය.

III. වෘත්තීය සමිති සියල්ලම වෙනුවෙන් එක් නියෝජිතයෙකු බහුතර වෘත්තීය සමිතිවල කැමැත්ත අනුව තෝරා ගත යුතුය. වෘත්තීය සමිති ආඥාපනත අනුව නියෝජිතයන් තෝරාගත යුතුය.

**31. තොරතුරු රැස් කිරීම හා රැස්වීම් වාර්තාකරණය:**

* ගුරු මාරු මණ්ඩල හා අභියාචන මණ්ඩල රැස්වීම්වලදී ගනු ලබන තීරණ මණ්ඩලයේ ලේකම් සටහන් කර වාර්තා කළ යුතුය.

* වාර්ෂික ස්ථාන මාරු අන්තර්ජාලය ඔස්සේ මෘදුකාංගයක් මඟින් සිදු කළ යුතුය.

**32. විදුහල්පතිවරුන් වාර්ෂික ස්ථාන මාරු කිරීම විදුහල්පති ස්ථාන මාරු ප්‍රතිපත්තිය අනුව සිදු කළ යුතුය.**

**33. සදාචාරාත්මක හැසිරීම පිළිබඳ වූ ගුරු ආචාරධර්ම පද්ධතිය.**

සදාචාරාත්මක හැසිරීම පිළිබඳ වූ ගුරු ආචාරධර්ම පද්ධතියට පුළුල් වශයෙන් අයත් වන්නේ තමන් වෙත පනවාගත යුතු අවංකත්වය, වගකීම, ඍජු බව සහ ආදර්ශවත් සමාජ වගකීම ඇති පුද්ගලයන් වශයෙන් ගුරුවරුන්ගෙන් අපේක්ෂා කරන ආකල්ප වගකීම් හා චාරිත්‍ර වාරිත්‍රය. ඒ සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පහත ආකාරයට විය යුතුය.

**(1) ගුරුවරයා පුද්ගලයෙකු වශයෙන්,**

යහපැවැත්ම, විනය හා යහපත් චර්යාවෙන් යුතු, ආදර්ශවත්, සමාජ නියමුවෙකු ලෙස ගුරුවරයෙකුගෙන් පහත සමාජ අපේක්ෂාවන් ඉටු විය යුතුය.

(අ) තමා මනා සෞඛ්‍යයෙන් සිටීමට අවශ්‍ය පිළිවෙත් අනුගමනය කරමින් ශරීර ස්වස්ථතාව සහ පිරිසිදු බව පිළිබඳ සම්මතයන් පිළිපැදීම.

(ආ) සෑම විටම විනීත හා සංවරභාවය රැකෙන පරිදි සංස්කෘතියට අනුකූලවූ පිරිසිදු, චාම් මනා පිළිවෙළට සැකසූ ඇඳුමින් සැරසී සිටීම.

(ඇ) මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය, දුම්පානය, බුලත්විට සැපීම වැනි අහිතකර පුරුදුවලින් හා විවිධ අපචාරවලින් වැළකී සිටීම සහ අන් අයට එසේ වැළකී සිටීමට අනුබල දීම.

(ඈ) පෞද්ගලික හා සාමාජීය හැසිරීම පිළිබඳව අපකීර්තියට ලක්වූ පුද්ගලයින් ආශ්‍රය නොකිරීම.

(ඉ) තමන් ඇසුරු කරන ගුරුවරුන්, සිසුන් හා අන් අය ඉදිරියේ තමන්ගේ ධනවත්කම, පවුල් සම්බන්ධතා හා උසස් නිලතල දරන පුද්ගලයන් ආශ්‍රය පිළිබඳව පුරසාරම් නොදෙඩීම.

(ඊ) තමන්ගේ ධනය, පවුල් සම්බන්ධතා සහ උසස් නිලතල දරණ පුද්ගලයන් සමග ඇති හිතවත්කම් අනෙක් ගුරුවරුන්, සිසුන්, වෙනත් පුද්ගලයන් සමග ඇති හිතවත්කම් අනෙක් ගුරුවරුන්, සිසුන්, වෙනත් පුද්ගලයන් බිය ගැන්වීමට හෝ ඔවුන්ට හානියක් සිදු කිරීමේ අදහසින් ප්‍රයෝජනයට නොගැනීම හා එසේ කටයුතු කරන පුද්ගලයින් ඉදිරියේ අභීතව හැසිරීම.

(උ) තම පෞද්ගලික ජීවන දර්ශනය හෝ ආගම, දේශපාලන මතය ආදී කරුණු සම්බන්ධව තම පෞද්ගලික මතවාද පිළිගැනීමට සිසුන් පෙළඹවීමෙන් වැළකීම.

(ඌ) පෞද්ගලික බැඳීම් මත සිසුන් කෙරෙහි ප්‍රතිචාර නොදැක්වීම.

(එ) සිසුන්ට මානසික පීඩා පෙනෙන ලෙස අනවශ්‍ය ඉඟි නොකිරීම.

(ඒ) කිසියම් විෂයයක්, භාෂාවක් හෝ වෙනත් ක්ෂේත්‍රයක් පිළිබඳව තම සුවිශේෂී හැකියාවන් අන් ගුරුවරුන් හෙළාදැකීම පිණිස යොදා නොගැනීම.

(ඓ) මතවාදී පුද්ගලයින් ඉදිරියේ අන්තවාදී නොවීම හා අන්තවාදී ස්ථාවරයන් බැහැර කරමින් සමබර පුද්ගලයකු ලෙස මනාව හැසිරීම.

(ඔ) අසාධාරණ, අයුතු ලෙස කොන්කිරීම සහ බියවැද්දීම, ඉදිරියේ තමන්ගේ සහෝදර ගුරුභවතුන්, සිසුන් හෝ වෙනත් අයෙකු ආරක්ෂා කරගැනීමට සැමවිටම සූදානමින් සිටීම.

(ඕ) පන්ති කාමරයේ සහ ඉන් බාහිරව සිසුන් සමග කටයුතු කරන අවස්ථාවල දී ජංගම දූරකථන භාවිතයෙන් වැලකී සිටීම.

(ඖ) සැමවිටම සමාජ සම්මතයන්ට ගරුකරමින් සිරිත් විරිත් ගතිපැවතුම් හා පෞද්ගලිකත්වය ආදි සෑම ආකාරයකින්ම දරුවන්ට සහ සමස්ත සමාජයට ආදර්ශවත්වන පරිදි හැසිරීම.

(ක) මිනිසුන් හෝ සතුන් පිළිබඳව සාහසික ක්‍රියාවන් සිදුවන අවස්ථාවක තමන්ගේ සංවේදීතාව පෙන්වා ක්‍රියාකිරීම හා ස්වාභාවික හෝ මිනිසා විසින් කරනු ලබන ක්‍රියාවක් නිසා හෝ උදාසීනත්වය, නොසැලකිල්ල නිසා හෝ පීඩාවට පත් අයට සහ කම්පනය දක්වමින් උදව් උපකාර කිරීම.

**(2) ගුරුවරයා දෙමාපියන් වෙනුවට**

පාසල් ශිෂ්‍යයින් සම්බන්ධයෙන් ගුරුවරයා ශිෂ්‍යයින්ගේ ස්ථානීය දෙමාපියන් නම්වූ නීතිමය සංකල්පය සැලකිල්ලට ගෙන,

(අ) සෑම විටම දෙමාපියන් හා දරුවන් තමා වෙත තබා ඇති විශ්වාසය ආරක්ෂා කිරීම හා දෙමාපිය භාරකරුවන් කෙරෙහි දරුවන්ගේ විශ්වසනීයත්වය තහවුරුවන ආකාරයට කටයුතු කිරීම.

(ආ) කුලය, විශ්වාසයන්, ස්ත්‍රී පුරුෂභාවය, සමාජ තත්ත්වය, ආගම, භාෂාව, උපන් ස්ථානය යන සාධක නොසලකා හැර සියලු සිසුන්ට සාධාරණව හා අපක්ෂපාතීව ආදරය, සැලකිල්ල හා ආරක්ෂාව සැපයීම.

(ඇ) තම සිසුන්ට ඔවුන්ගේ නමින් හෝ දුව, පුතා ලෙසින් පමණක් ආමන්ත්‍රණය කිරීම.

(ඈ) ශිෂ්‍යයින්ට පැවතිය හැකි විශේෂ අවශ්‍යතා, ගැටලු සම්බන්ධව විමසිලිමත්ව සිටීම හා එවැනි සිසුන්ට අවශ්‍ය පහසුකම් සැලසීමටත් අවශ්‍ය පරිදි විශේෂඥ උපදෙස් ලබාදීමටත් කටයුතු කිරීම.

**(3). ගුරුවරයා දැනුම ලබා දෙන්නෙකු, කුසලතා හා ආකල්ප සංවර්ධනය කරන්නෙකු ලෙස**

දැනුම ලබාදීම, කුසලතා හා යහපත් ආකල්ප සංවර්ධනය කිරීම ගුරුවරයාගේ මූලික වගකීම ලෙස සලකා ගුරුවරයා පහත සඳහන් ආකාරයට කටයුතු කළ යුතුය.

(අ) එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තියේ (1989) ප්‍රකාරව ළමයින් සතු අයිතීන් තහවුරු වනසේ කටයුතු කිරීම.

(ආ) සෑම විටම මනා සූදානමකින් තම වගකීම ඉටුකිරීම.

(ඇ) ලබාදෙන දැනුම නිවැරදි බවත්, අදාළ බවත්, ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට යෝග්‍ය බවත් සහතික කිරීම.

(ඈ) විෂයයන් ඉගැන්වීම සම්බන්ධයෙන් සාකල්‍යවාදි (Holistic) ප්‍රවේශයන් අනුගමනය කිරීම.

(ඉ) ඉගැන්වීම් කාලය තුළ ප්‍රශ්න ඇසීමට හා සාකච්ඡා කිරීමට උනන්දු කරවීම තුළින් සිසුන්ගේ විචාරාත්මක චින්තනය වර්ධනය කර ගැනීමට අවකාශ සැලසීම.

(ඊ) පාඩමට අදාළ අතිරේක තොරතුරු ලබාගැනීමට අවශ්‍ය සිසුන්ට ඒ සඳහා තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයන් පැහැදිලි කර දීම හා තමන්ගෙන් වැඩිදුර තොරතුරු විමසීමට අවකාශ ලබාදීම.

(එ) සිසුන් ස්වයං අධ්‍යයනයට පෙළඹවීමට අවශ්‍ය පහසුකම් සැලසීම. විශේෂයෙන් සිසුන් කියවීම සඳහා පෙළඹවීම.

(ඒ) සිසුන්ගේ ආකල්ප වර්ධනය කරන්නෙකු සහ ඒ සඳහා පොළඹවන්නෙකු ලෙස ක්‍රියා කිරීම.

(ඔ) කිසිවිටකත් තම සිසුන්ගෙන් මුදල් අයකරගෙන ඉගැන්වීමේ නොයෙදීම.

**(4) ගුරුවරයා නිර්මාණාත්මක මග පෙන්වන්නෙකු සහ උපදේශකයෙකු ලෙස,**

නිර්මාණාත්මක මග පෙන්වන්නෙකු සහ උපදේශකයෙකු ලෙස තමන් භාරයට පත්වන ශිෂ්‍යයන් සඳහා අනර්ඝ සේවයක් ගුරුවරයෙකුගෙන් ඉටු විය යුතු බැව් සලකා,

(අ) එම වගකීම ඉටුකරනු පිණිස දැනුමෙන්, කුසලතාවන්ගෙන් හා යහපත් ආකල්පයන්ගෙන් යුතුව මනාව සූදානම් වීම.

(ආ) ශිෂ්‍යයින්ට තිබිය හැකි දුබලතා හා ගැටලු සම්බන්ධව විමසිලිමත්ව සිටිය යුතු අතර, එවැනි ගැටලු නිරාකරණයට අවශ්‍ය විශේෂඥ උපදෙස් ලබාදීමට පියවර ගැනීම.

(ඇ) සිසුවකු සම්බන්ධ දුබලතා හෝ ගැටලු පිළිබඳ රහස්‍ය තොරතුරු එම සිසුවාගේ දෙමව්පියන් හා නීත්‍යානුකූල භාරකරුවන් හැර වෙනත් අයට හෙළි නොකිරීම.

(ඈ) දෙමාපියන් සමග සුහද සම්බන්ධතාවක් පවත්වා ගනිමින් අවශ්‍ය අවස්ථාවලදී ඔවුන්ට තම දරුවා සම්බන්ධ ගැටලු නිරාකරණය සඳහා තමන් වෙත පහසුවෙන් ළඟාවීමට අවස්ථාවක් සලසාදීම.

(ඉ) කිසිවිටකත් ගුරු සිසු සම්බන්ධතා අනිසි ලෙස ප්‍රයෝජනයට නොගැනීම හා සිසුන් අපචාරයන්ට හා අපයෝජනයට ගොදුරුවීමට ඇති අවස්ථා වලින් වළක්වා ගැනීමට කටයුතු කිරීම.

(ඊ) සැම විටම සිසුවාගේ දැනුම, කුසලතා හා සමාජ සාරධර්ම සංවර්ධනයට කටයුතු කිරීම.

**(5). ගුරුවරයා ඇගයීම්කරුවකු ලෙස,**

තක්සේරුව හා ඇගයීම, ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රියාවලියේ වැදගත් අංග සේ සලකා ගුරුවරයා,

(අ) නිරන්තරයෙන් ඒ සඳහා අවශ්‍ය දැනුම යාවත්කාලීන කර ගැනීම සහ ඒ හා සබැඳි තම දැනුම, කුසලතා, ආකල්ප සංවර්ධනය කර ගැනීම.

(ආ) ශිෂ්‍යයන් තුළ තිබිය හැකි ඉගෙනුම් දුබලතා සහ ගැටලු පිළිබඳව විමසිලිමත්ව සිට ඒවාට පිළියම් යෙදීම සඳහා අවශ්‍ය විශේෂඥ උපදෙස් ඇතුළුව සියලු පියවර ගැනීම.

(ඇ) සිසුන් කෙරෙහි කිසිම භේදයක් හා පුද්ගල බද්ධතාවයකින් තොරව විනිවිද භාවයකින් හා විශ්වසනීයත්වය ගොඩනැගෙන පරිදි ඇගයීම් කටයුතු කිරීම.

**(6) ගුරුවරයා වෘත්තිකයෙකු ලෙස,**

න්‍යායික දැනුම හා කුසලතාසම්භාරයක් අත්පත්කර ගැනීම හේතුවෙන් ගුරුවරයා වෘත්තිකයෙකු ලෙස සලකනු ලබන හෙයින්

(අ) ගුරු වෘත්තියට ආවේණික වූ උසස් සම්ප්‍රදායන් හා උත්තරීතරභාවය සැමවිටම ආරක්ෂා කිරීම.

(ආ) තමන්ගේ වෘත්තීය දැනුම හා කුසලතා උසස් මට්ටමින් තබා ගැනීම මෙන්ම යාවත්කාලීන කරගනු ලැබීම අනිවාර්ය වේ.

(ඈ) ඉගැන්වීම වෘත්තියක් මෙන්ම සේවයක් ලෙස සැලකීම රඳාපවතින්නේ ගුරු ප්‍රජාව තුළ අවශ්‍ය දැනුම කුසලතා, ආකල්ප තිබීමත්, ගුරුවරයා තම දැනුම, කුසලතා, ආකල්ප අන් අය සමග බෙදා ගැනීමත් සියලු ගුරුවරුන්ගේ දැනුම, කුසලතා හා ආකල්ප වර්ධනය සඳහා උදේගය යුතුව සහයෝගය දැක්වීමත් මතය.

(ඈ) ගුරුවෘත්තියට අවශ්‍ය සුදුසුකම් නොමැති වීමෙන් වෘත්තිය අපකීර්තියට පත්වනබැවින් ගුරුවරයා විසින් අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කරගැනීම සහ සහෝදර ගුරු භවතුන්ගේ සේවා අභිවෘද්ධිය සඳහා අවශ්‍ය සහාය ලබාදීම.

(ඉ) අවශ්‍ය සුදුසුකම් හා නිපුණතා නොමැති ගුරුවරුන්ගේ ශ්‍රේණිය උසස්කිරීම වෘත්තියට හානිකරවන බැවින් ඔහු සුදුසුකම් සපුරන තුරු උසස්වීම් අපේක්ෂා නොකිරීම හා සුදුස්සන්ට උසස්වීම් දීමට ගන්නා වැඩපිළිවෙළට සහායදීම.

(ඊ) තම වෘත්තිය පිළිබඳ අභිමානයකින් හා යහගැලීමකින් කටයුතු කිරීම.

(උ) සියලු සිසුන් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබාදීම තුළින් මහජන විශ්වාසය දිනා ගැනීම.

(ඌ) ස්වකීය පෞද්ගලික හෝ වෘත්තීය අරමුණක් හෝ ප්‍රතිලාභයක් වෙනුවෙන් ශිෂ්‍ය ප්‍රජාවගේ ජීවිතවලට හෝ ඔවුනගේ අනාගතයට අහිතකර ලෙස බලපෑ හැකි ක්‍රියා මාර්ග ගැනීමෙන් වැළකීම සහ එවැනි අහිතකර/ අයථා ක්‍රියාමාර්ග සඳහා අනුබල නොදීම.

(එ) සිසුන්, අනෙක් ගුරුවරුන්, නිලධාරීන්, දෙමාපියන් ඉදිරියේ තමා සමඟ සේවයකරන්නන් විවේචනය නොකරමින්, විෂය හා විෂය බාහිර සෑම ක්‍රියාකාරකමකදීම ආයතනයතුළ දී සහ ඉන් පිටතදීත් මනාසහයෝගයකින් සහ සාමූහිකත්වයෙන් යුතුව කටයුතු කිරීම.

(ඒ) ඉදිරි වර්ෂයේ කටයුතු සඳහා අවශ්‍ය වන ලිඛිත වාර්තා හා වාචික තොරතුරු නිසිපරිදි ස්වකීය අනුප්‍රාප්තිකයාට ලබාදීම.

(ඔ) වෘත්තියේ ගෞරවයට හානිකර අයථා තත්ත්වයන් උද්ගත වූ වහාම ඒවා අදාළ බලධාරින්ට වාර්තා කිරීම.

**(7) ගුරුවරයා කළමනාකරණයේ වගකිවයුත්තෙකු ලෙස**

(අ) තම වෘත්තීයට බලපාන නීතිරීති, ඉහළ කළමනාකරණය කෙරෙහි තමා සතු වගකීම පිළිබඳව දැනුවත්වීම.

(ආ) පාසැල හා සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට සහයවීම.

(ඇ) කළමනාකරණ උපදෙස් පිළිපැදීම හා ගැටලු සහගත අවස්ථාවල දී ඒ සම්බන්ධයෙන් විධිමත්ව සන්සුන්ව ප්‍රශ්ණ කිරීම.

(ඈ) තම වෘත්තිමය ක්‍රියාකාරකම් සහ ඒවාගේ ප්‍රතිඵල පිළිබදව අන්‍යෝන්‍ය ගරු කිරීමක් ඇති කරගැනීම.

(ඉ) සියලු රාජකාරී කටයුතු නිසි බලධාරීන් හා නිසි මාර්ගයන් මගින් සාධාරණව ඉටුකර ගැනීම.

**(8) සමාජයේ හා දේශයේ පෙරගමන්කරුවෙකු ලෙස**

ගුරුවරයා නිරතුරුව සමාජයේ හා දේශයේ පෙරගමන්කරුවකු ලෙස සලකනු ලබන හෙයින්,

(අ) සමාජ ගැටලු හඳුනාගැනීම හා එම ගැටලුවලින් නිර්මාණය කරන ලද අභියෝගවලට මුහුණදීමට හැකි ක්‍රියාකාරකම්හි දරුවන් යොදවමින් දේශහිතෛෂී දරු පැරපුරක් සමාජයට දායාද කිරීමට කටයුතු කිරීම.

(ආ) විවිධ ජන කොට්ඨාස, ආගමික හා භාෂා කොටස් අතර, සාමය ගොඩනැගෙන ආකාරයට සිසුන්තුල යහපත් සිතුවිලි හා සාරධර්ම වගාකිරීම තුළින් ජාතික ඒකබද්ධතාව හා සමාජ සංහිඳියාව තහවුරුවන අයුරින් කටයුතු කිරීම.

(ඇ) තම පාසලට, සමාජයට, රටට හා ජාතියට හිතෛෂීව කටයුතු කරමින් තම සිසුන්ද ඒ මගෙහි ගමන් කරවීම.

**34. ගුරු ආචාරධර්ම පද්ධතියට පටහැනිව සිදු කරන කටයුතු සම්බන්ධයෙන් උතුරු මැද පළාතේ විනය කාර්ය පටිපාටියට හෝ රජයේ ආයතන සංග්‍රහයෙහි විධි විධානයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.**

**35. ගුරුවරයා මනා හැසිරීම, විනය සහ යහපත් චර්යාවෙන් යුත් පුද්ගලයෙකු ලෙස ගුරුවරයෙකුගෙන් අපේක්ෂිත සමාජ අපේක්ෂාවන්ට අනුකූලව ඔහු විසින් පහත සඳහන් නියෝග පිළිපැදිය යුතුවේ.**

(අ) සුරාසැල් සහ සුදු ක්‍රීඩා පැවැත්වෙන අපකීර්තිමත් ස්ථානයන්හි නොගැවසිය යුතුය.

(ආ) සූදුවට, සුරාපානයට, දුම්බීමට, මත් ද්‍රව්‍ය භාවිතයට ඇබ්බැහිවූ පුද්ගලයෙකු ලෙස අපකීර්තියක් ලැබෙන අයුරින් නොහැසිරිය යුතුය.

(ඇ) සෑම අවස්ථාවකදීම සංවරව හැසිරිය යුතු අතර සභ්‍ය වචන කථා කළයුතුය.

(ඈ) මුදල් පොළියට දීම, ශරීර සෞඛ්‍යට හා සමාජ යහපැවැත්මට අහිතකර අන්දමේ ජීවනෝපායන්හි හෝ ක්‍රියාවන්හි නොයෙදිය යුතුය.

(ඉ) ගැටුම් නිරාකරණය, මානව අයිතිවාසිකම්, ළමා හා කාන්තා අයිතිවාසිකම් සම්බන්ධයෙන් වූ මූලධර්ම පිළිපැදිය යුතුවන අතර, ළමුන් ගෘහසේවයේ යෙදවීම, ඔවුන් අපචාරයට හා අපයෝජනයට ලක්කිරීම වැනි ඉහත මූලධර්ම උල්ලංඝනය කරනු ලබන ක්‍රියාවන්හි නිරත නොවිය යුතු මෙන්ම එවැනි ක්‍රියාවන්ට සහයෝගය දීම නොකළ යුතුය.

36. පාසල් සිසුන් සම්බන්ධයෙන් දෙමාපියන්ගේ ස්ථානය ගුරුවරයා විසින් ගනු ලබන හෙයින් සැමවිටම, ශිෂ්‍යයෙකුට හෝ ශිෂ්‍ය පිරිසකට විශේෂත්වයක් දැක්වීම නොකළ යුතු අතර, කිසිදු භේදයකින් තොරව සැමට සාධාරණව සැලකීමත් අතිරේක අවධානය අවශ්‍ය අය සඳහා විශේෂ සැලකිල්ලක් දක්වා කටයුතු කිරීමත් කළ යුතුය.

37. ගුරුවරයා දැනුම දෙන්නෙකු ලෙස, කුසලතා හා ආකල්ප වර්ධනය කරන්නෙකු ලෙස දැනුම ලබාදීම, ආකල්ප හා කුසලතා වර්ධනය තම මූලික වගකීම ලෙස සලකා පහත සඳහන් කරුණු ඉතා සැලකිල්ලෙන් පිළිපැදිය යුතුය.

I. තම වගකීම ඉටු කිරීමට මනා ලෙස සූදානම් වීම.

II. ලබාදෙන දැනුම, කුසලතා, ආකල්ප, නිවැරදි බවත් අදාළ බවත් යොදාගන්නා ක්‍රමවේද ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට වයස හා ස්වභාවය අනුව යෝග්‍ය බවත් සහතික කිරීම.

III. පාසල තුළ දි මෙන්ම පාසලෙන් බාහිරව ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියේදී සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳව මුළුමනින්ම සහතිකවීම.

IV. අතිරේක තොරතුරු සහ අතිරේක තොරතුරු ලබාගැනීමේ ක්‍රමවේදයන් දැනගැනීමට අපේක්ෂා කරන ශිෂ්‍ය-ශිෂ්‍යාවන්ට තමන් වෙතට නොපැකිළිව පැමිණීමට අවකාශ සැලැස්වීම.

V. ඍජු හෝ වක්‍රව සිය විෂයයට හෝ පාඩමට ඇතුළත් කරුණු, ශිෂ්‍ය විනය හා ශික්ෂණයට ආදාළ කරුණු හැර වෙනත් නිෂ්ප්‍රයෝජන කරුණු සිසුන් සමග සාකච්ඡා කිරීමෙන් වැළකීම.

**38. විදුහල්පතිවරයාගේ අනිවාර්ය වගකීම්,**

I. ගුරුවරුන් සඳහා කාල සටහනක් ලබාදීම සහ ඔවුන් අධීක්ෂණය ඍජුව සහ පාසලේ නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ මාර්ගයෙන් සිදු කිරීම විදුහල්පතිගේ වගකීම වන්නේ ය.

II. පාසැල් කාලය තුළ උපරිම ලෙස ඉගෙනුම, ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා දරුවන් යොමු කිරීමට විදුහල්පති වගබලා ගත යුතු ය.

III. කොට්ඨාස, කලාප, පළාත්, ජාතික තරග සඳහා සිසුන් සූදානම් කිරීම යටත් පිරිසෙයින් තරග ආරම්භයට ලිත් මාසයකට පෙර සිට සිදු කළ යුතු වේ. ඒ සඳහා පිළිවෙළින් විදුහල්පති, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, වග බලාගත යුතු ය.

IV. පාසැල් කාලය තුළ බාහිර උත්සව සඳහා දරුවන් සහභාගි කරවීම සහ බාහිර උත්සව පාසැල් තුළ පැවැත්වීමට ඉඩදීම පළාත් අධ්‍යාපන ලේකම්ගේ නිසි අවසරයකින් මිස සිදු නොකළ යුතුය.

V. පාසැල් පැවැත්වෙන දිනයන්හි විධිමත් පරිදි පෞද්ගලික, අනියම්, රාජකාරි නිවාඩු ලබා නොගෙන රාජකාරි කාලය තුළ පාසලින් බැහැරව නොයා යුතුය.

VI. වාර සටහන අනුව විෂය නිර්දේශය ආවරණය කිරීම පිළිබඳ විදුහල්පති පෞද්ගලිකව වගකිව යුතු ය. ගුරුවරුන් මඟින් එය ඉටු කරවීම විදුහල්පතිවරයාගේ වගකීමක් වන්නේ ය.

VII. පාසල් වෙත අමාත්‍යාංශය ලබා දී ඇති අනුමත ගුරු, විදුහල්පති හා අනධ්‍යන කාර්ය මණ්ඩල සටහන අනුව අවශ්‍ය වන්නා වූ කාර්ය මණ්ඩලය පමණක් පාසලේ රඳවා ගැනීම විදුහල්පතිගේ වගකීම වන අතර අතිරික්ත කාර්ය මණ්ඩලය සිටීනම් කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කළ යුතු ය. අතිරික්ත කාර්ය මණ්ඩලය විධිමත්ව ස්ථානගත කිරීම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ සිදු කළ යුතු ය.

VIII. පාසල් තුළ අතිරික්ත කාර්ය මණ්ඩල සිටී නම් එය තුලනය නොකිරීමට එරෙහිව අදාළ පාසලේ විදුහල්පතිට, කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂකට හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට එරෙහිව විනයානුකූල හා නීත්‍යානුකූලව කටයුතු කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හා පළාත් අධ්‍යාපන ලේකම් ක්‍රියා කළ යුතු ය.

IX. තමන්ට නිසි කාල සටහනක් නොමැතිව යම් පාසලක ගුරුවරයකු රැඳී සිටීම විනයානුකූලව හා නීත්‍යානුකූලව දඬුවම් ලැබීමට කරුණක් වන බවට සැලකිය යුතුය.

X. අධ්‍යයන කාර්යයන්හි යෙදවිය යුතු ගුරුවරුන් හෝ විදුහල්පතිවරුන් කලාප සහ කොට්ඨාස අධ්‍යාපන කාර්යාලවල රඳවා ගැනීම කිසිසේත් නොකළ යුතු අතර යම් කාර්යයක් සඳහා එසේ රඳවා ගන්නේ නම් ඒ සඳහා පළාත් අධ්‍යාපන ලේකම්ගේ විධිමත් ලිඛිත අවසරය ලබා තිබිය යුතු ය.

XI. අධ්‍යයන කාර්ය මණ්ඩලයට මෙන්ම අනධ්‍යන කාර්ය මණ්ඩලයට ද වෘත්තීන් ගරුත්වය ආරක්ෂාවන පරිදි ආමන්ත්‍රණය කිරීම සහ රාජකාරි පැවරීම කළ යුතු ය.

**39. මොනයම් හේතුවක් නිසාවත් අනධ්‍යයන කාර්ය මණ්ඩල සේවකයන් කලාප අධ්‍යාපන කාර්යාල වලට හෝ කිසියම් වෙනත් කාර්යාල වලට අනුයුක්ත නොකළ යුතුය.**

**40. අනධ්‍යන කාර්ය මණ්ඩල වල සේවය කරන කාන්තාවන් සඳහා කාන්තා අයිතිවාසිකම්වලට හානි නොවන පරිදි සේවයේ නොයෙදවිය යුතුය.**

**41. අනධ්‍යයන කාර්ය මණ්ඩලවල රසායනාගාර සහායකයන් රසායනාගාරවල සේවයේ යෙදවිය යුතුය.**

**A** පෝර්මය

## ගුරු සේවයේ ස්ථාන මාරුවීම් ඉල්ලුම් පත්‍රය - උතුරු මැද පළාත

(අන්තර් පළාත් සඳහා පිටපත් 5ක්, අන්තර් කලාප පිටපත් 3ක්, කලාප පිටපත් 2ක් වශයෙන් ඉදිරිපත් කළ යුතු ය)

ස්ථාන මාරුවීම් අංකය [ ]

1. සම්පූර්ණ නම :...................................................................................................................
...................................................................................................................හිමි/මයා/මිය/මෙනවිය
2. වැටුප් ලේඛනයේ සඳහන් නම :.............................................................හිමි/මයා/මිය/මෙනවිය
3. පාසල හා එහි ලිපිනය : ...................................................................................................
..........................................................දුරකථන අංකය ..............................................
4. පෞද්ගලික ලිපිනය ...............................................................................................................
..........................................................දුරකථන අංකය..............................................
5. ගුරු වර්ගය :............................උගන්වන විෂයන් :...............................ස්ත්‍රී/පුරුෂ භාවය...............
6. පාසල අයත් අධ්‍යාපන කොට්ඨාසය :..........................දිස්ත්‍රික්කය .............................................
7. තමා පදිංචි ප්‍රා. ලේකම් කොට්ඨාසය ............................දිස්ත්‍රික්කය...........................................
8. ස්ථාන මාරුව ඉල්ලන පළාත............................සිටින කලාපය...................................................
9. උපන් දිනය.............20.........12.31 ට වයස ................විශ්‍රාම යාමට නියමිත දිනය..........................
10. මුල් පත්වීම් දිනය.....................පත්වීම් ලත් දිස්ත්‍රික්කය......................අයත් කලාපය......................
11. ගුරු භවතා දැනට අයත් පංතිය හා ශ්‍රේණිය (3-II/3-I/2-II/2-I/I) සටහන් කරන්න..............................

12. අධ්‍යාපන නිවාඩු සහ වැටුප් රහිත නිවාඩු විස්තරය

| *අධ්‍යයන නිවාඩු ගැනීමට හේතු වූ පාඨමාලාව/ආයතනය* | *දින සිට* | *දින දක්වා* | *මුළු නිවාඩු කාලය* | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| වැටුප් රහිත නිවාඩු ගැනීමට හේතුව | | | ආසන්න වසර තුනක ගත් වැටුප් රහිත නිවාඩු | | |
| | | | පළමු | දෙවන | තෙවන |
| | | | | | |

(වැටුප් රහිත නිවාඩු වැඩිපුර ඇත්නම් මුළු දින ලණන මෙහි මුළු නිවාඩු කාලයේ කොටසේ දක්වන්න)

13. මුල් පත්වීම් ලිපියට අනුව පළමු පාසලේ සේවය සඳහා බැඳී ඇති සේවා කාලය .............වෙනත් පත්වීම් කොන්දේසි ...............................................................................................

14. සේවා සටහන දැනට සේවය කරන පාසලට පත් වූ දිනය...............එහි මුළු සේවා කාලය....................
උ. මැ. ප. සේවා කාලය.........................................

| *පාසල හා ලිපිනය* | *දිස්ත්‍රික්කය* | *කලාපය* | *කොට්ඨාසය* | *සිට* | *දක්වා* | *පාසල් වර්ගය* | *ලැබූ දුෂ්කර දීමනාව* | *ලකුණු* |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |
| | | | | | | | | |

(දැනට යොදා ගන්නා පාසල් වර්ගීකරණයෙන් පාසල් වර්ගය සඳහන් කරන්න. (ඉතා ප්‍රියමනාප/ප්‍රියමනාප/ප්‍රියමනාප නොවන/දුෂ්කර/අති දුෂ්කර) ලෙස සටහන් කරන්න. 5%, 10%, 15% ලෙස)

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

ගුරු භවතා ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාව [ ]

පමුඛතා ලේඛනයේ ඔබේ අංකය [ ]

..............................
කලා/පළාතේ ප්‍රමුඛතා ලේඛනයේ ඔබේ අංකය [ ]

15. සිවිල් තත්ත්වය

| කාලත්‍රයාගේ නම | පදිංචි ලිපිනය | සේවා ස්ථානයේ ලිපිනය |
|---|---|---|
| | | |

16. වයස 12ට අඩු දරුවන් පිළිබඳ විස්තරය

| නම | පදිංචි ලිපිනය | වයස | ඉගෙනුම ලබන පාසල |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

උප්පැන්න සහතික වල සහතික කළ පිටපත් 4ක් ඇමිණිය යුතු ඃ

................................
................................
................................
................................
................................
................................
................................
................................
................................
................................
................................
................................
................................
................................
................................

පරික්ෂා කළ මාරු මණ්ඩල නියෝජිතයන්ගේ කෙටි අත්සන් (ගුරු සංගමයද සඳහන් කරන්න.)

17. අවිවාහක නම් මව පියාගේ තොරතුරු (ඔබේ උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපත් 4ක් ඇමිණිය යුතුයි)

| නම | ලිපිනය | උපන් දිනය | 20..........12.31 ට වයස |
|---|---|---|---|
| | | | |
| | | | |

18. ස්ථාන මාරුව ඉල්ලීමට හේතුව

(අඹු සැමි හේතුව නම් විවාහ සහතිකය, දරුවන් සම්බන්ධ නම් උප්පැන්න සහතික, දෙමාපියන් සම්බන්ධ නම් ඔබේ උප්පැන්න සහතිකය සත්‍ය පිටපත් බවට සහතික කර ඇමිණිය යුතුයි. තමා/මව/පියා/කාලත්‍රයාද දරුවන්ගේ අසනීප තත්ත්වය මත ස්ථාන මාරුව ඉල්ලන්නේ නම් ප්‍රතිකාර සටහන් ඇමිණිය යුතුයි.

ඔබගේ මුල් පත්වීම් ලිපියේ පිටපතක් ද අමුණන්න.

(ඔබගේ තොරතුරු සවිස්තරාත්මකව ඉදිරිපත් කිරීමට ඇති ඉඩ ප්‍රමාණවත් නොවන්නේනම් එයට අදළ ජේද අංකය සහිතව වෙනත් කොළයක ලියා අමුනන්න (එය අදළ නිලධාරියෙකු සහතික කර තිබිය යුතුයි)

මෙවර සිට උතුරු මැද පළාතේ ස්ථාන මාරු සිදු කරනුයේ පළාත් ස්ථාන මාරු ප්‍රතිපත්තිය යටතේය. නියමිත දිනට හෝ එදිනට පෙර ඔබගේ ඉල්ලුම්පත් විදුහල්පති වෙත භාරදිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.

කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා

උතුරු මැද පළාත් ගුරු මාරු ප්‍රතිපත්තීන්ට අනුව පාසල් සඳහා හිමිවන ලකුණු

දිඹුලාගල, කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාප සහ මැදිරිගිරිය, විලච්චිය අධ්‍යාපන කොට්ඨාස සඳහා එක් වසරකට

අති දුෂ්කර 6
දුෂ්කර 5
අනෙකුත් පාසල් 4
ඉහත නොවන ප්‍රදේශවල පාසල් සඳහා වසරකට

අති දුෂ්කර/දුෂ්කර 4
ප්‍රිය මනාප නොවන 3
ප්‍රියමානප 2
ඉතා ප්‍රියමානප 1
සේව කාලය වසරක් වෙනුවෙන් 1
විවාහය සඳහා 2
වයස අවු. හතට අඩු දරුවෙකු සඳහා 2
පෙර සේවා කාලය උතුරු නැගෙනහිර නම් වසරක් සඳහා 1
උතුරු නැගෙනහිරට ස්ථානමාරු ඉල්ලන්නේ නම් ලකුණු ක්‍රමයට පරිබාහිරව පත්වීම් ලිපියේ කොන්දේසි උල්ලංඝනය නොවන ලෙස සේවා කාලයෙන්ද පරිබාහිරව ලබාදෙනු ඇත. ලකුණු ක්‍රමයට පරිබාහිරව සේවා කාලය පදනම් කරගෙන පළාතෙන් නිදහස් කිරීමේ දී වසර දහයක සේවාව කාලයක් තිබිය යුතු බව ද සලකන්න.

19. ස්ථාන මාරුව ඉල්ලන පළාත
ස්ථාන මාරුව ඉල්ලන පාසල කැමැත්තේ අනුපිළිවෙලට 5ක් නම් කරන්න

| පාසල | ලිපිනය | පාසල් වර්ගය | දිස්ත්‍රික්කය | අ. කලාපය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

අපේක්ෂිත පාසල්වල නැතිනම් ඉල්ලා ඇති කොට්ඨාසයේ වෙනත් ඕනෑම පාසලකට ස්ථාන මාරුව ලබා ගැනීමට කැමතිද ? ................................................................................

........................... ................................
දිනය ඉල්ලුම්කරුගේ අත්සන.

**විදුහල්පති වර්තාව අදාල චක්‍රලේඛයට අනුව විදුහල්පති විසින් පිරවිය යුතුය.**

| ශිෂ්‍ය සංඛ්‍යාව | | | අයදුම්කරුගේ විෂය අනුව ගුරු සංඛ්‍යාව | | මෙම වර්ගයේ ස්ථාන මාරු ඉල්ලා ඇති ගුරු සංඛ්‍යාව | | සිටින මුළු ගුරු සංඛ්‍යව | |
|---|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය | පන්ති සංඛ්‍යාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | | | | | | |
| 1-5 | | | අනුමත | | අන්තර් පළාත් | | අනුමත | |
| 6-11 | | | සිටින | | අන්තර් කලාප | | සිටින | |
| 12-13 | | | ඌන | | කලාප තුළ | | ඌන | |
| එකතුව | | | අතිරික්ත | | එකතුව | | අතිරික්ත | |

මෙම ගුරුභවතාගේ ස්ථාන මාරුව ලැබුණහොත් පාසලේ ඇතිවන පුරප්පාඩුව

ස්ථාන මාරුව ලබා දීමෙන් වැඩ ආවරණය කළ හැකිය./නොහැකිය. මෙම වර්ගයේ පාසලෙන් නිදහස් කළ හැක්කේ ගුරුවරුන් ......... ක් පමණි.

........................................................................................................................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවට සහතික කරමි. ස්ථාන මාරුව නිර්දේශ කරමි/නොකරමි.

........................ ................................ ................................
දිනය නිල මුද්‍රාව විදුහල්පති

**කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකගේ නිර්දේශය**

කලාපයේ මෙම වර්ගයේ සිටිය යුතු ගුරු සංඛ්‍යාව............. මෙම වර්ගයේ දැනට සිටින ගුරු සංඛ්‍යාව.......................
මෙම වර්ගයේ අතිරික්ත ගුරු සංඛ්‍යාව.........................මෙම වර්ගයේ ඌන ගුරු සංඛ්‍යාව..........................
ස්ථාන මාරුවීම් ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දින වන විට
කලාපයෙන් පිටතට ස්ථාන මාරුවීම් ඉල්ලා ඇති මෙම වර්ගයේ ගුරු සංඛ්‍යාව...............................................
ලිපිගොනුව භාර ලිපිකරුගේ නම...............................................අත්සන.......................
ගුරුවරයා/ගුරුවරිය ඉදිරිපත් කර ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ ලිපිගොනුවෙන් සනාථ වෙයි. වැරදි තොරතුරු සපයා නොමැති බවත් විදුහල්පති පුරවා ඇති තොරතුරු නිවැරදි බවත් දන්වමි.

ස්ථාන මාරුව නිර්දේශ කරමි/නොකරමි.

දිනය.......................නිල මුද්‍රව...............................................කලාප භාර නි. අ. අ. අත්සන.......................

**ගුරු මාරු මණ්ඩලයේ නිර්දේශය**

අදාළ ලකුණු සම්පූර්ණ කර ඇති නිසා මානුෂික හේතු මත/වෛද්‍ය හේතු මත/අතිරික්ත නිසා ස්ථාන මාරුව අනුමත කරමු./නොකරමු.
සාමාජික අත්සන් (ගුරු සංගමය සමග සටහන් කරන්න)

1. ................................ 2................................ 3......................................
4. ................................ 5................................ 6......................................
7. ................................ 8................................ 9......................................

දිනය..................................

................................ නිල මුද්‍රාව

...................................... මාරු මණ්ඩල ලේකම් අත්සන

...................................... මාරු මණ්ඩල සභාපති/ පළාත් කලාප අධ්‍යක්ෂ

---

**පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය (අන්තර් පළාත් සඳහා)**

ගුරු මාරු මණ්ඩලයේ නිර්දේශය පරිදි ස්ථාන මාරුව අනුමත කරමි/නොකරමි.

................................ දිනය

.................................. නිල මුද්‍රාව

........................................... පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සන.

---

**පළාත් රාජ්‍ය සේවා කොමිසම (අන්තර් පළාත් සඳහා)**

ලේකම්

...........................................................පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

මෙම ගුරු භවතා උතුරු මැද පළාතෙන් නිදහස් කිරීමට තීරණය කර ඇත.

ඔහු/ඇය ඔබ පළාත් රාජ්‍ය සේවයට අන්තර්ග්‍රහනය කර ගැනීමට එකඟවන්නේ ද යන්න මා වෙත දන්වන්නේ නම් මැනවි.

................................ දිනය

.................................. නිල මුද්‍රාව

........................................... රාජ්‍ය සේවා කොමිෂන් ලේකම්

B පෝරමය

## ස්ථාන මාරු තොරතුරු පත්‍රිකාව - අධ්‍යාපන අමාත්‍යාංශය, උතුරු මැද පළාත

1. ගුරුවරයාගේ නම :-

2. මුල් පත්වීම් දිනය :-

3. ගුරු වර්ගය : ……………………. ශ්‍රේණිය ………… විෂය …………..
(උදා : උපාධි, 3-(i) අ - විද්‍යාව)

4. විවාහක/අවිවාහක බව :-

5. කලත්‍රයාගේ නම හා සේවා ස්ථානය :-

6. දරුවන් සංඛ්‍යාව :-

7. සේවය කරන පාසල :- කලාපය : …………………..

8. පෙර සේවා තොරතුරු :-

සේවය කළ පාසල සිට………..………..දක්වා

(1) ………………………….. ………………………..
(2) ………………………….. ………………………..
(3) ………………………….. ………………………..
(4) ………………………….. ………………………..
(5) ………………………….. ………………………..
(6) ………………………….. ………………………..
(7) ………………………….. ………………………..
(8) ………………………….. ………………………..

9. ස්ථාන මාරු ඉල්ලන පළාත/කලාපය/පාසල :-

10. ස්ථාන මාරු ඉල්ලීමට හේතුව :-

11. ස්ථාන මාරු ඉල්ලීමට පැමිණි වාර ගණන :-

දිනය …………………… ගුරුභවතාගේ අත්සන ……………………………………

විදුහල්පතිගේ නිර්දේශය

| | අනුමත | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|
| පාසලට අදාළ මුළු ගුරු සංඛ්‍යාව | | | | |
| විෂයට අදාළ මුළු ගුරු සංඛ්‍යාව | | | | |

ස්ථාන මාරුව නිර්දේශ කරමි/නොකරමි.

දිනය :............................................ විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව .....................................................

කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :-

| | අනුමත | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|
| කොට්ඨාසයට අදළ මුළු ගුරු සංඛ්‍යාව | | | | |
| විෂයට අදළ ගුරු සංඛ්‍යාව | | | | |

ස්ථාන මාරුව නිර්දේශ කරමි/නොකරමි.

දිනය :.................................කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව .....................................................

කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය :-

| | අනුමත | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|
| කලාපයට අදළ මුළු ගුරු සංඛ්‍යාව | | | | |
| විෂයට අදළ ගුරු සංඛ්‍යාව | | | | |

ඉහත තොරතුරු අනුව ස්ථාන මාරුව නිර්දේශ කරමි/නොකරමි.

දිනය :.................................කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව .....................................................

ස්ථාන මාරු අපේක්ෂිත පාසලේ විදුහල්පතිගේ නිර්දේශය :-

| | අනුමත | සිටින | ඌන | අතිරික්ත |
|---|---|---|---|---|
| කලාපයට අදළ මුළු ගුරු සංඛ්‍යාව | | | | |
| විෂයට අදළ ගුරු සංඛ්‍යාව | | | | |

අදළ විෂය සඳහා පුරප්පාඩු පවතින බව නිර්දේශ කරමි/නොකරමි.

දිනය :.................................විදුහල්පතිගේ අත්සන හා නිල මුද්‍රාව .....................................................

පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අනුමැතිය

.........................................................දින සිට/වහාම ක්‍රියාත්මක වන පරිදි ..............................................................කලාපයේ

..........................................................................................................විද්‍යාලයට ස්ථාන මාරු කිරිම අනුමත කරමි.

.................................................................................................................................ස්ථාන මාරුව අනුමත නොකරමි.

දිනය :.................................පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන හා නිල මුද්‍රාව .....................................................

10-43

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.